IHRA
UNIVERSITY OF COLOMBO

**මානව සම්පත් අභිවර්ධන ආයතනය**

# ශ්‍රම අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව - 2026/ 2027

## අයදුම්පත පිරවීම සඳහා උපදෙස් ලේඛනය

---

ඔබගේ අයදුම්පත ඉදිරිපත් කිරීමට පෙර කරුණාකර මෙම උපදෙස් හොඳින් කියවන්න.

1. **ශ්‍රම අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව - (වසර 01) හැදෑරීම සඳහා අවශ්‍ය අවම සුදුසුකම් :**

   1.1 අ.පො.ස (සා.පෙ) විභාගයෙන් අවම වශයෙන් විෂයන් 06ක්, සම්මාන (C) සමාර්ථ තුනක් සහිතව එකවර සමත්වීම.

   **සහ**

   1.2 අවුරුදු 22ට නොඅඩු අයෙකු වීම.

   ඉහත 1.1 දක්වා ඇති අධ්‍යාපන සුදුසුකම් සපුරාලීමෙන් පසුව වසර දෙකක කාලයක්,

   (i) රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ රැකියාවක නිරත වූවෙකු වීම.

   **හෝ**

   (ii) ස්වයං රැකියාවක නිරතවූවෙකු වීම.

   **සහ**

   1.3 උක්ත පාඨමාලාව හැදෑරීම සඳහා අයදුම්කරුගේ යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා මානව සම්පත් අභිවර්ධන ආයතනය මඟින් පවත්වන යෝග්‍යතා පරීක්ෂණයෙන් ඉහළ ලකුණු ලබා සමත්වීම සහ ඉන් අනතුරුව පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයෙන් සමත්වීම අනිවාර්යය වේ.

2. **අයදුම්කරුවන්ගේ වයස හා වසර දෙකක සේවා කාලය නිර්ණය කරන ආකාරය.**

   ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අයදුම්කරන සෑම අයදුම්කරුවෙකුම 2026.04.06 දිනට වයස අවුරුදු 22ට නොඅඩු අයෙකු විය යුතු අතර එම දිනට වසර දෙකකට නොඅඩු රාජ්‍ය /පෞද්ගලික ආයතනයක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

   ඔබ ස්වයං රැකියාවක නියුක්ත අයදුම්කරුවෙකු නම්, **2026.04.06** දිනට වසර දෙකකට පෙර තම ව්‍යාපාරය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි කර තිබිය යුතුය.

3. **තෝරාගැනීම**

   3.1 ඉහත පාඨමාලාව සඳහා අදාළ සුදුසුකම් සපුරා ඇති රැකියාධාරී අයදුම්කරුවන් යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් වූ පසුව සම්මුඛ පරීක්ෂණයක් මඟින් තෝරාගනු ලැබේ. පාඨමාලාව සඳහා තෝරාගැනීමේ සම්පූර්ණ වගකීම මානව සම්පත් අභිවර්ධන ආයතනය සතු වන අතර, අදාල සියලුම කරුණු පිළිබඳ අවසාන තීරණය ආයතනයේ කළමණාකරන මණ්ඩලය සතුවේ.

   3.2 අයදුම්පත් භාරගන්නා අවසන් දිනය 2026.03.31 වන අතර එම දිනට ප්‍රථම අයදුම්කරුවන් විසින් තම අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

